# තානායමේ අභිරහස



භාග්‍යා වීරසිංහ

# තානායමේ අභිරහස

භාග්‍යා වීරසිංහ

තානායමේ අභිරහස

භාග්‍යා වීරසිංහ

© භාග්‍යා වීරසිංහ

ISBN 978-624-206-618-9

කතෘගේ වෙනත් කෘති

- අභිරහසේ පියසටහන්
- පුදුම ඉස්කෝලේ

2023-11-15

## පිදුම

මහාමායා බාලිකා විද්‍යාලයේ සියලුම ගුරු

මෑණිවරුන්ට සහ පියවරුන්ටද,

මාගේ දෙමව්පියන්ටද,

මෙම පොත නිර්මාණය කර ගැනීම සඳහා

සහය දුන්

සියලු දෙනාටද,

මාගේ ස්තූතිය පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් මප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිතසමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙෂ හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි. 2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදූහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# පටුන


| | |
|---|---|
| 01 ප්‍රෙහේලිකාවක් | viii |
| 02. අත්භූත තැනක් | xii |
| 03. කළුවර වූ තානායම | xv |
| 04. ගඟ අසල රැයක් | xvii |
| 05. පැහැරගැනීමක් | xx |

මෙය ඇලිසන්ගේ නිවාඩු සමය විය. ඇය සමඟ  නිවාඩු සමය ගත කිරීමට ඇගේ ඥාති සොයුරන් වන ජෝන් සහ මරියා ඇගේ නිවසට පැමිණීමට බලාපොරොත්තු වෙති. ඔවුන් දෙදෙනා සමග සතුටින් කාලය ගතකිරීමට ඇලිසන් ඇඟිලි ගනිමින් සිටියි.

# 01 ප්‍රෙහේලිකාවක්

ඇලිසන් උදෙන් ම අවදි විය. ඊට හේතුව ඇගේ ඥාති සොහොයුරන් අද ඇයගේ නිවසට පැමිණීමයි.

"අම්මා, තාත්තා ගියා නේද අර දෙන්නා එක්ක ගෙන එන්න?" ඇලිසන් ඇසීය.

"ඔව් දූ" ඇගේ මව මේරි උත්තර දුන්නා ය.

"එහෙනම් හරි, අම්මා මගේ කිරි එක හදන්නකෝ මම මූණ සෝදගෙන එන්නම්"

"හරි දුව ඉක්මනට එන්න"

"කිරි එක මේසෙ උඩ තියෙනවා පුතේ"

"හරි අම්මේ"

ඇය කිරි එක බී අවසන්ව නිවස ඉදිරිපිටට ගොස් මරියා සහ ජෝන් එනතරු මඟ බලා ගෙන සිටියා ය. කාරයේ නළා හඬ ඇසී ඇය ගේට්ටුව වෙත දුව ගොස් එය විවෘත කළා ය. කාරය ඇතුළු කෙරුණි මරියා හා ජෝන් එයින් බැස ගත්හ.

"සුබ උදෑසනක් දෙන්නටම" ඇලිසන් සුබ පැතීය.

"සුබ උදෑසනක්" මරියා සහ ජෝන් එකවර සුබ පැතීය.

එවිටම ඇලින්ගේ මව මේරි එතැනට පැමිණියා ය

"ආ ඔයාලා ආවද?"

"ඔව් නැන්දේ"

"ඔයාලා කතා කර කර ඉන්න මම එයාලට බොන්න මොනවහරි ලෑස්ති කරන්න ද, නැත්තම් උදේ කෑම ම කනවද?"

"උදේ කෑමම කමු නැන්දේ"

"එහෙනම් මම ලෑස්ති කරන්නම්."

"ඉතින් පුතා කොහොමද?" තාත්තා විමසීය.

"හොඳින් ඉන්නවා මාමේ"ජෝන් පිළිතුරු දුන්නේ ය.

"අම්මා එහෙම හොඳින්ද?"

"ඔව්, අම්මා කිව්වා මාමව මතක් කරන්න කියලා."

"මමත් අම්මව මතක් කළා කියන්න."

"හා මාමේ."

"කෑම ලෑස්තියි." නැන්දා කීවා ය.

"එන්න යමු කෑම කන්න." ඇලිසන් මරියාව කෑම සෙයට එක්ක ගෙන යමින් කීය.

සියලු දෙනා කෑම මේසයේ හිඳ ගනිමින් කෑමට සූදානම් වූහ.

"කන්න පුතේ. කෝපි එකකුත් බොමු නේද?" අම්මා ඇසීය.

"අනේ එපා නැන්දේ. මේ හොඳටම ඇති. හරිම රහයි" මරියා කීය.

"ඔහොම ඉන්නකො මම හදාගෙන එන්නම්." නැන්දා කීවා ය.

අපි අමා සැදූ රසවත් කෝපි පානය කර කෑම කා අවසන් වුණෙමු.

"අපි දැන් මොකද කරන්නෙ?" ඇලිසන් විමසී  ය.

"ඔයාගෙ පුස්තකාලෙට ගිහිල්ලා පොත් කියවමුද?" මරියා යෝජනා කළාය.

"මං හිතන්නේ ඒක තමයි කරන්න තියෙන හොඳ ම දේ"ජෝන් කීය.

"ෂා..... ඇලිසන් ඔයා මේක තවත් ලස්සනට හදා ගෙන මමත් ලොකු වෙලා හදාගන්නවා පුස්තකාලයක්." මරියා බලාපොරොත්තු සහිතව කීය.

"ලොකු වෙනකන් ඉන්නෙ මොකටද දැන්ම පටන් ගන්න මමත් දෙන්නම් පොත් ටිකක් දෙන්නම්." ඇය ධෛර්යමත් කරමින් ඇලිසන් කීවා ය.

"හා... මොනවද අලුත් පොත්." මරියා ඇසුවේ පොත් රාක්කය දෙසට ඇවිද යමිනි.

"ඔය තුන්වෙනි රාක්කයේ හතරවෙනි තට්ටුවේ තියෙන්නෙ අලුත් පොත්. ඔයාලා එනවා කිව්ව නිසා  මම ඒවා වෙනම තට්ටුවකින් තිබ්බා."

"ආ... මේ තියෙන්නේ හොඳ පොතක්. අර ජනේලය ළඟ පුටුව මගේ." මෙතෙක් නිශ්ශබ්දව සිටි ජෝන් කීය.

"අනේ මමනෙ එතන ඉඳ ගන්න හිටියේ." මරියා කෙඳිරි ගාමින් කීවා ය.

"බෑබෑ ආය එතන දෙන්නෙ නෑ." ජෝන් කීය.

"අයියෝ... දැන් දෙන්නා රණ්ඩු කරන්නේ නැතුව ඉන්නකෝ තව නිවාඩු දවස් කොච්චර තියෙනවද?" ඇලිසන් එය සමතයකට පත් කළා ය.

සියලු දෙනා සැප පහසු අසුන්වල වැතිරී පොත් කියවන්නට වූහ.

"ළමායි... අපි කෑම කන්න අද එළියට යනවා. දැන් ඔය පොත් කියෙව්වා ඇති නේද?" මවගේ හඬ ඔවුන්ව ධ්‍යානයෙන් අවදි කරවීය.

එදින දවල් කෑම සඳහා අපි ඉතාලි අවන්හලකට ගියෙමු.

**

"හරිම කම්මැලි අනේ අපි එහා ගෙදර විලියම් එක්ක සෙල්ලම් කරන්න යමුද?" ඇලිසන් යෝජනා කළා ය.

"අනේ ඔයාලා ආවද? ඇලිසන් ඊයෙ මට කිව්වා ඔයාලා එනවා කියලා." විලියම්ගෙන් එලෙස උණුසුම් පිළිගැනීමක් ලැබුණි.

"ඔයාට කොහොමද විලියම්?"

"හොඳින් ඉන්නවා. ඔයාලත් හොඳින්නෙ."

"වරදක් නෑ. විලියම් කෝ කිටී?"

" කිටී ...."

"කිටී කොහෙද ඔයා?" විලියම් කිටීට කතා කළේ ය.

"ඤාව්....." කියා කිටී ඊට පිළිතුරු සැපයී ය.

"අනේ කිටී ඔයානම්"

"ආ ඒක නෙවෙයි අපි මොකක්ද කරන සෙල්ලම?" මරියා ඇසී ය.

"මට නම් ටිකක් මහන්සියි වගේ. ඔයාලා සෙල්ලම් කරන්න." ජෝන් කීය. ඉන්පසු ජෝන් පුටුවක් වෙත ගොස් හිඳ ගත්තේ පත්තරයක් අතට ගනිමිනි.

ඇලිසන් දිගු හුස්මක් ගෙන මෙසේ කීවාය.

"එයත් ගියා"

"අපි ස්නේක් ඇන්ඩ් ලැඩර් කරමුද?" විලියම් අදහසක් ගෙනාවේ ය.

"නියමයි මම හරි ම ආසයි ඒකට." මරියා කීය.

"ඔහොම ඉන්න මම ඒක අරන් එන්නම්" කියා විලියම් ගෙදරට ගියේ ය.

මරියාට මුලින්ම තරගය පටන් ගැනීමට වාසනාව ලැබුණි.

සෙල්ලම අතරතුර කාගේත් නෙත් ජෝන් දෙසට දිගුවිය. ජෝන් පත්තරයේ තිබූ යමක් අවධානයෙන් කියවීය. ටික වේලාවකට පසු ජෝන් පත්තරයද රැගෙන ඇලිසන්ගේ නිවස දෙසට දිව ගියේය. අනිත් තිදෙනා ද සෙල්ලම අතරමග නවතා දමා ඔහු පසුපස දිවගියහ.

"ජෝන් මොකද මේ?" මරියා විමසීය.

"පොඩ්ඩක් ඉන්න. ම්.... ඔව් මම හරි මෙහෙම දෙයක් කලිනුත් සිද්ධ වෙලා තියෙනවා." ජෝන් තමන්ගේ සිත් ඇදගත් පත්තර කොටස් අලවන ස්ක්‍රැප් පොත බලා කීය.

"ඔයා මොනවද මේ කියන්නේ?"

"ඔයාලට මතකද එක දවසක් ඒ කියන්නේ මීට අවුරුද්දකට විතර කලින් මනුස්සයෙක් ලිවන්පූර් උද්‍යානයට ගිහිල්ලා අතුරුදන් වුණා. ඒ වගේ කෙනෙක් ආයෙමත් අතුරුදන් වෙලා බලන්නකො මේ පත්තරේ. මෙයා මාධ්‍යවේදියෙක්." මේ කියා ජෝන් දෙසට අත දිගු කරමින් කීය.

එයා වැඩ කරපු ආයතනයෙන් තමා මේක දාලා තියෙන්නෙ. මේ තැන ගැන හොයන්න තමා මෙයාව යවලා තියෙන්නෙ.

"ඔය පත්තරේ වැඩියෙන් විකුණගන්න කරන වැඩ අනේ. කවුද ඕවගෙ ඇත්ත නැත්ත දන්නෙ අනේ?" විලියම් කීය.

"මම හිතන්නෙ මෙතන ඊට වඩා දෙයක් වෙලා. තියෙනවා පත්තරේ දාන්න තරම්." ජෝන් කීය.

"මමත් හිතනවා." ඇලිසන් ජෝන්ට එකග වෙමින් කීය.

"අපිත් යමුද?" ජෝන් විමසීය.

“කොහෙද අනේ?”මරියා විමසී ය.

“ලිවන්පූර් උද්‍යානයට.” ජෝන් කීය.

“ඔයාට පිස්සුද අනේ විහින් මැරෙන්න ද යන්නෙ?” මරියා විමසීය.

“මැරෙන්න?”

“ඔව්. මැරිලා නැත්තම් ඔහොම මිනිස්සු අතුරුදහන් වෙනවද?”

“අනේ මේ”

“ඔයාට බැරිනම් නිකන් ඉන්න මරියා. අපි දෙන්නා මැරෙන්න හරි යමු ජෝන්.”ඇලිසන් කීය.

“ඔව් මේ බයගුල්ලි එක්ක මුකුත් බැනෙ. ඔහොම ඉන්නකො මම මාමගෙන් අහන්නම්.”ජෝන් කීය.

“අන්තිමේට මම තමා වැරදි.”

“අයියෝ ඔය දෙන්නගෙ රණ්ඩුනම් කවදා ඉවර වෙයිද දන්නෑ?”

“තාත්තා යන්න දෙයිද?” ඇලිසන් විමසීය.

“බලමු.” ජෝන් විශ්වාසවන්තව කීය.

ජෝන් රාත්‍රි කෑම අතරතුර ගමන ගැන විමසීය. නැන්දා ඒ ගමනට එතරම් කැමැත්තක් නොතිබුණි.

“කමක් නෑ මගේ ළමයින්ව මට විශ්වාසයි. වත්තේ වැඩ කරන වික්ටර් මාමත් එක්ක ගෙන යන්න.” මාමා කීය.

“ස්තුති තාත්තේ.” ඇලිසන් පියාව වැළඳ ගනිමින් කීය.

හෙට දින යාමට ඇති නිසා සියලු දෙනා වේලාසන නින්දට ගියහ.

## 02. අත්භූත තැනක්

පසුදා උදෑසන ගමන යෑමට සූදානම් විය. කැමරාවක්, දුරේක්ෂයක් ඇතුළු උපකරණ කිහිපයක් ඇතුළත් බෑගයක් සහ කෑම ඇතුළත් බෑගය ද ගෙන ගමන ආරම්භ කළහ. අප ගමන් ගත් කාරය දිරාගිය ගේට්ටුවක් ඉදිරිපිට නතර කෙරුණි. සියලු දෙනා කාරයෙන් බැස ගත්හ.

"අපිට මොන මොන දේවල් ඕන වේවිද දන්නෑ. ඒ නිසා අපි ගෙනාපු හැම බෑග් එකක් ම ගමු."ජෝන් කීවේ විශාල බෑගයක් කරේ දමා ගනිමින් කාරයෙන් බසිමිනි.

"හා." මරියා හා ඇලිසන් කීය.

උපිට දක්නට ලැබුණු දිරාගිය ගේට්ටුවේ එක් පියනක් යන්තම් විවෘතව තිබුණි. ඒ අසල පුවරුවක **ලිවන්පූර් උද්‍යානය හා තානායම** යනුවෙන් සඳහන් ව තිබුණි.

"වික්ටර් මාමා ඔයා මොනවද දන්නේ මේ තැන ගැන?" ඇලිසන් විමසුවේ ගමන ආරම්භ කරමිනි. මේක පටන් ගන්න කොට ඒ කිව්වෙ මේකෙ උද්‍යානයකයි තානාමකුයි හදනකොට  මට අවුරුදු 16 ක් හරි 17ක් වෙන්න ඕන. ඕක පටන් ගත්තෙ එඩ්වඩ් ග්‍රීස් මහත්තයා එඩ්වඩ් ඒ කාලෙ ධනවතා, මේ වගේ ඉඩමක් අරගෙන උද්‍යානයක් හදන්න. එඩ්වඩ් උද්‍යානය හදන්න සල්ලි වියදම් කළා විතරක් නෙවෙයි සල්ලි හෙව්වා. පිටරටවල් වලින් ආපු ධනවත් අය තමයි තානායමේ නවාතැන් ගත්තෙ. ඒකෙ හොඳ සැපපහසුකම් තිබුණා කියලා මම දැක්කෙ පත්තරේ වෙළඳ දැන්වීම් පිටුවේ. එඩ්වඩ්ට අවුරුදු 65 ක් විතර වෙනකොට මේක එයාගෙ පුතාට භාර දුන්නා. එතකොට මට මතක විදිහට එයාට වයස 30 ක් 35 ක් විතර වෙන්න ඕන. මමත් ඔය කාලෙ ආවා උද්‍යානෙ බලන්න හරිම ලස්සනට තිබුණා. එයා අවුරුදු දෙකක් තුනක් විතර තානායමේ වැඩ හොඳට කරගෙන ගියා. දවසක් තාත්තයි, පුතයි සාදයකට ගිහින් එනකොට කාර් එක ගහක හැප්පිලා. දෙන්නම බීමත්ව හිටියා කියලා පත්තරවල ගියා. දවස්පහක්හයක් ඇතුළත සේවයෝ හැමෝ ම අස්වෙලා ගියා රස්සා හොයාගෙන. ඒ මේක ගන්න තරම් සල්ලිකාරයෙක් නැති බව දැනගෙන. ජෝජ්ගෙ බිරිඳ ප්‍රංශයට සංක්‍රමණය වුණා. ජෝජ්ගේ අම්මා ජර්මනියේ අක්කා ළඟට ගිහින් එයාලා කරගෙන ගියපු ව්‍යාපාරයකට සම්බන්ධ වුණා. ඉතින් මේ උද්‍යානෙ නිකම්ම කැලයක් වගේ වුණා.

"අනේ අපරාදේ එහෙම වුණේ, එයා මැරුණේ නැත්තම් අදටත් මෙතන ලස්සනට තියෙයි." ඇලිසන් කීය.

"ඒක තමයි දුව. හරිම අපරාධයක් තමයි වුණේ."

අප ටිකින් ටික ඉදිරියට යත්ම ගොඩනැගිල්ලක් වැනි යමක් දුටුවෙමු. ළං වෙද්දී එය විශාල ගොඩනැගිල්ලක් බව දුටුවෙමු.

"මං හිතන්නෙ ඔය තියෙන්නෙ තානායම. ඔව්, වෙන ගොඩනැගල්ලක් තිබුණෙ නෑනෙ." වික්ටර් මාමා පැවසීය.

ඒ කාලෙ ඒක බොහොම ලස්සනයි. දැන් අවුරුදු10 කටත් කිට්ටුයිනේ. ගල් යොදා නිම කරන ලද තානාමේ ඉදිරි බිත්ති ගල් සෙවල වලින් වැසී  තිබුණි. එය අත්භූත තැනක් බව පෙනුණි. එකල උද්‍යානයේ තිබුණේ යැයි සිතිය හැකි මල් ද සුළු වශයෙන් දක්නට ලැබුණි.

එම අවස්ථාවේ ජෝන් ඒ අවට ඇවිද බැලුවේ ය.

"මේ බලන්න මම හිතන්නෙ නෑ මේක අවුරුදු 10කට කලින් ඇතිවුණ සළකුණක් කියලා." ජෝන් කීවේ පා සටහන් කිහිපයක් පෙන්වමිනි.

ඊළඟට අපි තරමක් දිරා ගිය ලී දොරටුවකින් ඇතුළු වුණෙමු.

"මේ දොර ඇරලනේ!" මෙතෙක් වෙලා නිහඬ ව සිටි මරියා පුදුමයෙන් කීය.

ඇතුළට පිවිසුණු අපට දැකගත හැකි වූයේ අන්ධකාරය පමණි. බිත්ති අත පත ගා බැලූ මරියාට ස්විච්චියක් හමුවිණි. එය දැමූ පසු හාත්පස ආලෝකය පැතිර ගියේ ය. පිඟන් ගඩොල්වලින් අලංකාර කර තිබූ එය චිත්‍රපටවල දකින ආකාරයේ මාලිගාවක් අපට සිහිගැන් වූයේ ය.

"මෙතනට තාම විදුලි සැපයුම තියෙනවා." ඇලිසන් කීය.

කවුන්ටරයක් යැයි සිතිය හැකි ස්ථානයක් බිම් මහලේ කොනක විය. එතැන අඩි තුනක් පමණ උසැති මේසයක් ද විය. කවුන්ටරය ඇතුළට ගිය ජෝන් මේසයේ ඇතුළත පැත්තෙහි තිබූ ලාච්චුවක් ඇද පොත් කිහිපයක් හා යතුරක් අතට ගත්තේ ය.

"මම හිතන්නෙ මේක නවාතැන් ගන්න ආපු අයගෙ විස්තර ලියන පොතක්." ජෝන් කීවේ කාවුන් විසින් කා දමා තිබූ පොතේ පිටු කිහිපයක් පෙන්වමිනි. තව ද පහළ මහලේ 'සෝෆා' පුටු 3ක් විය. පහළමහලේ කෙළවරේ කාමර දෙකක් විය. එයින් එක් කාමරයක OFFICE යන පුවරුවක් දුටුවෙමු. එහි ද මේසයක් සහ පුටු දෙකක් විය. එම මේසයේ තිබූ ලාච්චු යතුරු යොදා වසා තිබුණි. අනෙක් කෙළවරේ තිබූ කාමරය යතුරු යොදා වසා තිබුණි. ඒ හෙයින් අපි අලංකාර ලී වැටක් යොදා තිබූ පඩිපෙළ දිගේ ඉහළට ගියෙමු. එම මහලේ කාමර සංකීර්ණයක් විය. ඒවා සංචාරකයන් සඳහා නවාතැන් ගැනීමට වෙන්වූ ඒවා විය යුතු ය. එම මහල අඩි 70ක් පමණ දිගු විය. එහි වම් පැත්තට ජෝන් හා මරියා ගියහ. එහි දකුණු දෙසට ඇලිසන් යද්දී වික්ටර් මාමා පහළ මහලේ පුටුවක හිඳ සිටියේ ය. දෙදෙනා දෙපැත්තට යන අතරතුර ජෝන් සහ මරියා ගිය පෙදෙසින් යමෙකු කෑ ගසන හඬ ඇසී ඇලිසන් ඒ දෙසට දිව ගියා ය.

"කවුදෝ....කවුදෝ....ඉ..න්..නවා! " මරියා බයෙන් වෙව්ලමින් කීය."

"කෝ කොහෙද?" ඇලිසන් අවට පිරික්සමින් ඇසීය.

හො...ල්..මනක්...ද.. දන්නෙ නෑ...." මරියා කීය.

"අර ආව මිනිස්සු මරන්න ඇත්තෙ හොල්මන් වෙන්න ඇති."

මරියා හොඳට මබිය වී සිටි නිසා අපි එදිනට කටයුතු නතර කළෙමු.

නැවතත් සියලු දෙනාට එකට කතා කිරීමට හැකි වූයේ සවස තේ බොන අතරතුරය. ලිවන්පූර් ගමනේ දී ඇති වූ බිය නිසා මරියා තේ පානයට නොසිට ම විවේක ගත්තා ය. ඇය සමඟ ම ඇලිසන්ගේ මව මේරි සිටියා ය. චාරිකාවේ දී සිදු වූ දේවල් ජෝන් මාමාට විස්තර කළේ ය. රාත්‍රී ආහාරය ද අවසන් කළ පසු ජෝන් හා ඇලිසන් මරියා බැලීමට ගියහ.

ජෝන් මරියා සිටි කාමරයේ දොරට තට්ටු කළේ ය.

"ක....වු....ද..?" මරියා බියෙන් මෙන් ඇසී ය.

"මේ අපි"

"ආ...." මරියා දිගු සුසුමක් ගත්තා ය.

"එන්න"

ජෝන් හා ඇලිසන් එහි ඇතුළු විය.

"ඔයා තාමත් බයෙන් වගේ මොකක්ද මෙච්චර බය වෙන්න හේතුව?" ඇලිසන් විමසී ය.

"අයියා මුළුතැන්ගෙය බලලා දොරකින් එළියට ගියානේ, මුළුතැන්ගෙය තියෙන්නේ බරාඳිය දිගේ ගියාම වම් පැත්තෙන්. මමත් ඒ දිහා බලාගෙන, මුළුතැන්ගෙය බල බල හිටියේ. මට එක පාරටම දකුණු පැත්තෙන් මේසයක් හෙලවෙන ශබ්දයක් ඇහුණා. මම මේසය යට බලනකොට.. ඇය තම දෑස් පියා ගනිමින් මදකට නිශ්ශබ්ද විය.

බලනකොට කළු පාට රෙද්දක් පොරවගෙන දත් විරිත්තගෙන විරූපී යක්ෂයෙක් මං දිහා බලාගෙන ඔළුව එහාට මෙහාට හෙලෙව්වා. මම කලන්තෙ හැදෙන්නෙ නැතුව ඔයින් බේරුණා ඇති."

"යක්ෂයෙක්! ඔයාට හොඳටම විශ්වාසද ඒ මනුස්සයෙක් නෙවෙයි කියලා?" ජෝන් විමසී ය.

"මනුස්සයෙක්! මිනිස්සු ඔය විදිහට ඉන්නවද?" මරියා ඇසී ය.

"අයියේ මම ඔයාට ආයෙත් කියන්න කැමතියි, අපි ඕක අතඅරිමු. අර මිනිස්සු මරන්න ඇත්තෙ අර හොල්මන. මම මුල ඉඳලම කිව්වා ඔයාලට. අයියේ, ඔයාට පුළුවන්ද අද මගේ ළඟ නිදා ගන්න මට බයයි." මරියා ජෝන්ගේ අත අල්ලා ගන්මින් ඉල්ලීමක් කළා ය.

"ඉතින් ඔයා එන්න මං ළඟ නිදා ගන්න." ඇලිසන් කීය.

මරියා වහා ඇඳෙන් බැස ගනිමින් ඇලිසන්ගේ කාමරය වෙත ගියා ය.

"ඇලිසන්...."

"ඇයි?"

"මට බයයි ඇස් දෙක පියා ගත්තම මට හොල්මන් පේනවා."

"එහෙනම් ඇස් ඇරගෙන නිදාගන්න."

"අනේ විහිලු කරන්න එපා."

"හරි හරි ඔයා නිදාගන්නකො මම ඇහැරලා ඉන්නම්."

***

ඊළඟ දිනයේ උදේ කෑම වේල සඳහා සියලු දෙනා එකතු වූහ.

"මාමේ අපි අදත් යන්නද?"

"කොහෙද?"

"ලිවර්...."

"එපා පුතේ දැන් මේ වුණදේවල් හොඳට ම ඇති."

ටික දිනක් මෙසේ ගෙවුණු අතර පසුව ජෝන්ගේ කරදරය ඉවසන්න ම බැරි වූ පසු මාමා තානායමට යාමට අවසර දුන්නේ ය.

"ඔයාලා වික්ටර් මාමා එක්ක පරිස්සමින් ගිහින් එන්න. ඔයාලගෙ ජීවිත හරි වටිනවා පුතේ. ඒවා නැති වුණොත් ආපහු ගන්න බැරි බව මතක තියා ගන්න." තාත්තා අපට අවධාරණය කළේ ය.

"මරියා ඔයා එනවද?" ජෝන් ඇසුවේ තරප්පු පෙළ දිගේ ඉහළට නගිමිනි.

නළල රැලි කර සිතු මරියා "ඕන එකක් වෙන්න මාත් එනවා." යි කීවා ය.

ළමයි ගමන පිටත් වූහ.

# 03. කළුවර වූ තානායම

ඔයාලා දන්නවද මම ආයෙමත් එන්න හිතුවේ ඇයි කියලා අපි මීට කලින් හොල්මන් එක්ක සටන් කරලා නැනේ ඒකයි මරියා කීවේ සියලු දෙනා සිනහ ගන්වමිනි.

වෙනදා මෙන් ම අපි තානායමට ඇතුළු වුණෙමු. මරියා එහි බිත්තිය අත පත ගෑවේ ස්විච්චියෙන් විදුලි බුබුලු දැල්වීමටයි. නමුත් වූයේ කුමක්ද? එදා මෙන් විදුලි බුබුලුවලින් පහත මහල ආලෝකමත් වූයේ නැත.

"ජෝන්..... ඇලිසන්.... විදුලිය විසන්ධි වෙලා." මරියා කීය.

"ටෝච් එක ගන්න." ඇලිසන් කීය.

එය ක්‍රියා කළ පසු රේඛීය කිරණක් තරප්පු පෙළ දෙසට විහිදුණි.

"ඇයි දන්නේ නෑ එහෙම වුණේ?" වික්ටර් මාමා ද කතාවට එකතු විය.

"ඒක තමයි හොල්මන්ද දන්නේ නෑ." මරියා කීය.

හැම වෙලාවෙම ඔය කතාව කියන්න එපා මරියා. ජෝන් කීවේ විදුලි පන්දම් එළිය විහිදෙන ආකාරයට, විදුලි පන්දම එහා මෙහා කරමිනි.

අපි තරප්පු පෙළ දිගේ ඉහළ නැගුණෙමු.

ඉහළ මහළට ගිය අප වම් දෙසට ගියෙමු. මුළුතැන්ගෙයත්, මරියා කියූ මේසයත් අතර දොරක් තිබුණි. එය විවෘත වී තිබුණේ පඩිපෙළක් දෙසට ය. පඩිපෙළෙන් බැස ගිය පසු තිබුණේ උද්‍යානයයි.

විදුලි පන්දම් එළියෙන් අපි ඉදිරියට ගියෙමු. එතැනින් දකුණට හැරී ගිය විට පටු බරාඳයට පිවිසේ. එය අඩි 3ක් පමණ පළල විය. එම බරාඳය දිගට රතු පලසක් එලා තිබුණි. එතැනින් ද දකුණට හැරුණු විට මුළුතැන්ගෙය අසල තිබුණා සේ දොරක් හා පඩිපෙළක් විය. එය දිගේ ගොස් දකුණට හැරුණු විට පහළ මහලේ සිට ඉහළ මහලට පැමිණීමට තිබූ පඩිපෙළ දක්නට ලැබුණි. එවිට අපිට පෙනුණේ කාමර සංකීර්ණය වටා බරාඳ හතරක් තිබුණු බවයි. අපි ගමන අවසාන කර තරප්පු පෙළේ හිඳ ගත්තෙමු. ගමන් මල්ල එළියට ගත් ඇලිසන් සියලු දෙනා හට ක්‍රීම් බිස්කට් බෙදුවා ය. එකවර ම අපගේ ඇඟපත සීතල කරවමින් ශබ්දයක් ඇසුණි.

මගේ රාජධානියට ඇවිල්ලා නුඹලා කර ගත්තේ ලොකු වරදක්. දැන් ම මෙහෙන් පිටවෙලා ගියොත් හොඳයි.

එය අවසන් වූ පසු විදුලි බුබුලු දල්වෙමින් නිවෙමින් අත්භූත ස්වාභාවයක් ගෙන ආවේ ය. එකවර ම නැවතත් දසත අඳුර පැතිරී ගිය ද, විදුලි පන්දමෙන් ඍජු ආලෝකයක් පහත මහලට යොමු විය.

මෙතෙක් අපට අපගේ පාඩුවේ වැඩ කර ගන්නට දුන් වික්ටර් මාමා මෙවර තම මුව විවර කළේ ය.

"අනේ ඇලිසන් බේබි අපි දැන් යමු. මේක නම් භූත විමානයක්. දැන් වෙලා තියෙන දේවල් හොඳට ම ඇති. මම ආයේ නම් ඔය ළමයින්ට මෙහෙට එන්න තියන්නේ නෑ."

ඒ කීම ඇසූ අපි බිස්කට් කටේ ඔබා ගනිමින් සෙමෙන් තරප්පු පෙළ බසිමින් තානායමෙන් එළියට ගියෙමු. ජෝන් නැවත හැරී තානායම දෙස බැලුවේ ය.

"ජෝන් ආයේ තානායම දිහා බලන්නේ ඔයාට පිස්සුද? " මරියා විමසී ය.

"මට දොරක් වහනවා ඇහුණා."ජෝන් කීය.

“අයියෝ!” ඇලිසන් කීවේ නළලේ අත තබා හිස පහළට කරමිනි.

අපි ගෙදර ගොස් කාමරවලට වැදී සිදු වූ දෙය සිතන්නට විය.

එදින රාත්‍රී කෑම මේසයේ දී මරියා හා ඇලිසන් සිදු වූ සියලු  දේ නැන්දා හා මාමා වෙත දිග හැරියා ය. ජෝන් එදින නිහඬ විය. ආහාරයෙන් පසු සියලු දෙනා නින්දට ගියෝ ය.

“සුබ උදෑසනක් ජෝන්” මුළුතැන්ගෙයට යමින් සිටි මරියා කීය.

“සුබ උදෑසනක් අන්න නැන්දා එනවා” මරියා කීය.

ජෝන්, මරියා සුබ උදෑසනක්” නැන්දා කීය.

.සුබ උදෑසනක් නැන්දේ ඇලිසන් තාම නිදිද?” මරියා විමසී ය.

“මමත් මේ එයාව බලන්න කාමරයට යන ගමන්. කුස්සියේ කෝපි හදලා ඇති ගිහින් බොන්න උදේ කෑමෙන් පස්සෙ පොඩ්ඩක් සාලෙට එන්නකො පුතේ.” නැන්දා කීය.

උදේ කෑමෙන් පසුව ජෝන් මරියා හා ඇලිසන් සාලය වෙත ගියහ. තරප්පු පෙළ බැස ආ මාමා ගිනි උඳුන අසල වූ අසුනෙහි හිඳ ගත්තේ ය.

“ජෝන් ......”මාමා එසේ කියන විට පත්තරය බලමින් සිටි ජෝන් තිගැස්සී ය.

“මාමේ!”

“පහුගිය දවස්වල වුණ දේවල් එක්ක මම ඔයාලට කියන්නේ ඔය තතානායමේ වැඩේ අත ඇරලා කියලා. ඔයාලට මොකක් හරි කරදරයක් වුණොත් මම කෙහෙමද ඔයාලගෙ අම්මා තාත්තට මුහුණ දෙන්නේ. මම මොනවද වගේ නංගිට කියන්නේ? මේ වැඩේ අත ඇරලා දාන්න. ආයෙමත් ඒ පැත්තේ අඩියක්වත් තියන්න හිතන්නවත් එපා.” මාමා කීය.

“මේ නිවාඩුව කොච්චර ලස්සනට ගත කරන්න පුළුවන්ද? මාමයි මමයි මේ කතා කරේ ඔයාලා කැමතිනම් අපිට කෑම්පින් යන්නත් පුළුවන්.” නැන්දා කීය.

“අම්මේ ඒ අදහස නම් හොඳයි ඇත්තටම අපි යමුද ?” ඇලිසන් කීය.

“මමත් පොඩි කාලේ ඉස්කෝලෙන් ගිහින් තියෙනවා. රෑට ඇඳක් උඩ නිදා ගන්නවා වගේ නෙවෙයි කූඩාරමක් ඇතුළේ. මම නම් කැමති ඒත් මාමා......”

“මමත් කැමති. කවුද විනෝද වෙන්න අකමැති. දවසක් තමයි ප්‍රශ්නෙ. අපි අනිද්දා යමු මම ටිකක් කළින් වැඩ ඇරිලා එන්නම්. එතකොට ඔය තානායමේ වුණ හැම දේම අමතක වෙලා යාවි. මම යනවා එහෙනම්. වැඩට යන්න පරක්කු වෙනවා.” පුටුවෙන් නැගිට කබාය දමා ගන්නා අතර මාමා කීය.

නැන්දා ගෙනා යෝජනාව නිසා ඇලිසන් හා මරියා සතුටින් සිටියත්, තානායමට නොයන මෙන් මාමා කියූ නිසා ජෝන් සිටියේ දුකෙනි.

## 04. ගඟ අසල රැයක්

අගහරුවාදා සවස තුනට පමණ මාමා ගෙදර පැමිණි හෙයින් 3.30 පමණ වනවිට ගමන යා හැකි විය. පාරේ සිට ටික දුරක් පයින් යාමට අපට සිදුවිය. එතැනින් ටික දුරක් ඉදිරියට ගිය පසු අප දුටුවේ ගල් පර අතරින් ගලන ගඟයි. ගඟ හරහා තිබූ විවිධ ප්‍රමාණයේ ගල් අප දුටුවේ ගඟ හරහා යාමට සැදූ පාලමක් ලෙසයි. ගං ඉවුරේ සපත්තු ගැලවූ අප ගලෙන් ගලට පනින්නට විය. විශාල ගලක හිඳගත් අපි අපේ දෙපා ගං දියෙහි එබුවෙමු. ගඟ දිගේ ගලනා සීතල දිය දහර අපගේ දෙපා සීතලෙහි ගිල්වන්නට විය.

"ගඟේ වතුර හරි ම සීතලයි. කකුල් දෙකට සනීපයි නේද?" මරියා ඇසී ය. ඇලිසන්ගේ මව ගල උඩ සිටි අපගේ පින්තූරයක් ගත්තා ය.

"ළමයිනේ, එන්න තේ බොන්න" නැන්දා කීය.

"කොහෙන්ද නැන්දෙ තේ ?"

"මම ගෙදරින් හදාගෙන ආවෙ. ආ මෙන්න බනිසුයි, බිස්කටුයි තියෙනවා කන්න." නැන්දා කීය.

"පුතාලා තේ බීලා ඉවර වෙලා අර එහා පැත්තෙ තියෙන කැලේට ගිහිල්ලා දර කෑලි ටිකක් හොයාගෙන එන්න. වැඩිය දුර යන්න එපා දැන් රෑ වෙනවනේ, අපි ගිනි මැළයක් ගහන්න ඕන. එතකොට සත්තු එන්නෙ නෑනෙ." මාමා කීය.

"මේ කැලේ නපුරු සත්තු ඉන්නවද?" මරියා ඇසීය.

"ගොඩක් ලොකු සත්තු නෑ පොඩි පොඩි සත්තු ඉන්නෙ."

"එන්න අපි යමු දර හොයාගෙන එන්න." ජෝන් පෙරමුණ ගනිමින් කීය.

එම කැලයේ විශාල ගස් යට වැටී තිබූ වේලුණු දර කැබලි හා කොළ සුලබ ය. අප හොඳින් වේළී තිබූ දර ගෙනවිත් එකතු කරන්නට විය. ඒ අතර මාමා කූඩාරම සකසමින් සිටියේ ය.නැන්දා ඒ අවට පිරිසිදු කරමින් සිටියා ය.

"මාමේ මම උදවු කරන්නද?" ජෝන් විමසී ය.

"ඕක ඇදලා අල්ල ගන්න මම මේක ගහන්නම්."

කූඩාරම ගැසීමේ කාර්යය ජෝන් සහ මාමා විසින් නිම කරනලදී. ඉන්පසු නැන්දා සහ මාමා විසිනි ගිනි මැළය ගසන ලදී. ඇලිසන් හා මරියා විසින් ගෙන එනු ලැබූ කොට මතට ජෝන් රෙද්දක් එලුවේ ය. සවස 7.00 පමණ වන විට සියලු වැඩ නිමා විය.

නැන්දා පාන් පෙති අසුරන මල්ලක් සහ බටර් ගෙන එන ලදී. ඇය පාන් පෙත්වල බටර් තවරා එක්නෙකා වෙත දුන්නා ය. ගිනි මැළය නිසා අපට උණුසුමත් ආලෝකයත් ලැබුණි. මාමා තම ගිටාරය වාදනය කරන අතරේ අනෙක් අය ගීත ගයමින් සතුටු වූහ. ඉන්පසු නැන්දා කතන්දරයක් කීමට ඉදිරිපත් විය. ඈ තම මව තමා කියා දුන් අපූරු කතාවක් කීවා ය. එය ද කඳවුරු බැඳ රැයක් ගතකරන අතරේ සිදු වූ අත්භූත ත්‍රාසජනක කතාවකි. එය අසා සැවොම බිය වූහ. එය ඇසීමෙන් අනතුරු ව නින්දට යාමට තීරණය කෙරුණි.

ඇලිසන්,මරියා හා නැන්දා එක් කූඩාරමකත්, ජෝන් හා මාමා තව කූඩාරමකත් නිදා ගත්හ. සියලු දෙනා ම නින්දට ගියහ. ටික වෙලාවක් ගත වන්නට විය. මරියාට එක වර ම ශබ්දයක් ඇසුණි. ඇගේ නෙත් විවර විය. ටික වෙලාවකට පෙර ඇතින් ඇසුණු ශබ්දය කෙමෙන් කෙමෙන් තම කූඩාරමට ළං වන බව ඇයට හැඟුණි. දැන් ඌ හෝ ඔහු තම කූඩාරම අසල ය. ඈ ටිකක වෙලාවක් පොරවනයෙන් මුහුණ වසාගෙන සිටියා ය. එය ඉවත් කර දැමූ ඇය දැන් කූඩාරම විවෘත කර බලන්නට සැරසෙන්නී ය. සිත තුළ ඇති වන්නේ චකිතයකි. ඇගේ සිත එය කිරීමට ඇට ඉඩ නොදෙන්නේ ය. කූඩාරමෙ විවර කිරීමට සැරසෙයි. නැවත අත පසෙකට ගනී. නැන්දා අවදි කරන්න ද

සිතෙයි. ඈ තමාගේ සිත දැඩි කරගෙන එය විවෘත කළා ය. කුඩාරමෙන් එළියේ සිටියේ දැවැන්ත වළසෙකි. එම තප්පරය ඇතුළත විවිධ දේ සිතට ගලා ගෙන එයි. ඌ මා කාවි ද? ඈ විගස "නැන්දේ...." කියා කෑ ගැසුවා ය.

"ඇයි මරියා?" නැන්දා විමසී ය.

මරියා දැන් වේගයෙන් හුස්ම ගනී ඈ බිය වී තිබුණේ සිහිනයකට ය.

"හොඳ වෙලාවට ඒක හීනයක්. නැන්දා කිව්ව කතාව වගේ....."

"අයියෝ ඔය කතාවල තියෙන දේවල් ගනන් ගන්න එපා. ඕව ගැන හිතන්නෙ නැතුව නිදා ගන්න." නැන්දා මරියාගේ හිස අතගාමින් කීය.

උදෑසන වූ පසු සියලු දෙනා අවදි වූහ.

"මොකද්ද ඊයෙ රෑ ඇහුණ සද්දෙ?" මාමා විමසී ය.

"ආ ඔව් මටත් ඇහුණා මොකද්ද ඒ?" ජෝන් ද කතාවට එකතු විය.

"මේ මරියා හීනයක් දැකලා බයවෙලා." නැන්දා කීය.

අපි උදෑසන ම තේ පානය කළෙමු.

"ළමයිනේ ඔයාලා සතුටු වුණා නේද? දැන් ඉතින් අපිට යන්න වෙනවා." මාමා කීය.

"ඔව් මාමේ අපිට තව ටික වෙලාවක් මෙතන ඉන්න බැරිද?" මරියා පිළිතුරු දුන්නා ය.

"අපි මේවා අස්පස් කර ගන්නකන් ඔයාලා තව ටිකක් සෙල්ලම් කරන්නකෝ" නැන්දා කීය.

ජෝන් තම සටහන් පොතෙන් පිටු කිහිපයක් කඩා කඩදාසි බෝට්ටු සෑදී ය. ඉන්පසු අපි ඒවා ගඟේ පා නර හැරියෙමු. විටෙක ඒවා ගල්පර අතර නැවතුණ ද ජල පහරක් පැමිණි විට නැවත තම ගමන ඇරඹී ය.

"ළමයිනේ එන්න පින්තූරයක් ගන්න." මාමා කීය.

"අපි කාට කියලද පින්තූරය ගන්නෙ?" ඇලිසන් විමසී ය.

"ම්.... අර"

එවිට ම මාළු බෑමට යමින් සිටි පුද්ගලයෙක් එතැනට පැමිණියේ ය.

"මාමේ ටිකකට මෙහාට එනවද?" නැන්දා අත වනමින් විමසී ය.

"මට කතා කළේ මොකක් හරි උදවුවක් වෙන්න ඕනද?"

"අනේ අපිට ලස්සන පින්තූරයක් අරන් දෙනවද?"

"කෝ දෙන්න කැමරාව"

"අනේ හරි ලස්සනයි මේක. ඔයාට බොහො ම ස්තූතියි."

"ඕක මොකක්ද මම එහෙනම් යන්නම්."

"අනේ මගේ කැමරාව නැනෙ. මම හිතන්නෙ ඒක දර එකතු කරන්න ගිය වෙලාවෙ දාලා ඇවිල්ලා. මම ඒක හොයා ගෙන එන්නම් ඔයාලා යන්න." ජෝන් කීය.

"ඔයා හොඳට බැලුවද?" ඇලිසන් විමසී ය.

"ඔව් මම බෑග් එකේ බැලුවා එකේ නෑ" ජෝන් කීය.

"මට වැඩට යන්න පරක්කු වෙයි මම යනවා." මාමා කීය.

"මම ඉන්නම්." නැන්දා කීය.

"නැන්දත් යන්න." ජෝන් කීය.

"මමයි මරියයි ජෝන්ට උදවු වෙන්නම්." ඇලිසන් කීය.

"හොඳයි එහෙනම් පරෙස්සමින්." නැන්දා දුක්මුසු අයුරින් කීය.

නැන්දා හා මාමා පිට ව ගියහ. මිනිත්තු කිහිපයකට පසු  ජෝන් තම මුව විවර කළේ ය.

"මම නැන්දටයි මාමාටයි කළේ බොරුවක්. ඇත්තට ම මගේ කැමරාව ලිවර්පූල් තානායමේ. මම ඒක ගන්න ඕන." ජෝන් සමාව අයදින අයුරින් කීය.

"අනේ ඕක ඕන නෑ." මරියා කීය.

"එහෙම බෑ. මාමා ඇහුවොත් එහෙම හොයා ගත්තද කියලා?" ජෝන් ඇසී ය.

"නෑ අපිට බැරි වුණා කියමු" මරියා කීය.

"අනේ මම යන්නම්. ඔයාලට බැරි නම් ඉන්න." ජෝන් සැර පරුෂ ආකාරයෙන් කීය.

"ඔව් අපි යමු ජෝන් එක්ක" ඇලිසන් කීය.

තිදෙනා පිටත් වූහ.

## 05. පැහැරගැනීමක්

වෙනදා සේම තානායමට ඇතුළු විය අප තරප්පු පෙළට පය තබන විට ම ඉහළ මහළෙන් ශබ්දයක් ඇසුණි.

"මමයි මරියයි මෙතන හැංගෙනවා. ඔයා අතන හැංගෙන්න. අර පොඩි කැමරාව ඇඳුමෙ ගහගන්න." ජෝන් කඩිසර ව කීය.

ඇලිසන් OFFICE කාමරයේ සැඟවුණි. ජෝන් සහ මරියා කවුන්ටරය තුළ සැඟවුණි.

කිසියම් පිරිසක් තරප්පු පෙළ බැස පැමිණියහ.

"ඊයෙ අරගෙන ආපු තෙල් සායම් චිත්‍ර ඉක්මනට ප්‍රංශෙට යවන්න ඕන අපි එදා යවපු එක එවුලින්ට ලැබිලද? ඒකට කීයක් ලැබුණද?" කෙනෙකු විමසීය.

"ඊයෙ ගෙනාපු තීන්ත කුප්පිය යවන්න ලී බඩු අපි විල්සන් සමාගමෙන් ඇනවුම් කරලා තියෙන්නේ. ඒක ගන්න හැම්ෂයර් වීදියට යන්න ඕන. අර තීන්තවලට එවුලින් පවුම් 750 ක් දුන්නා." තවත් අයෙකු පිළිතුරු සැපයී ය.

එකවර ම ජෝන්ට කැස්සක් ඇතිවිය.

"මොකක්ද ඒ සද්දෙ? කවුන්ටරය පැත්තෙන් බලන්න."

එකවර ම උස උඩු රැවුලක් සහිත අයෙකු කවුන්ටරය දෙස එබී බැලී ය. ඔහු ජෝන් සහ මරියා අල්ලා ගත්තේ ය.

"මොනවා! මේ කරදරකාර ළමයි තාමත් මෙහෙ එනවද? ඉවරයක් කරලා දාන්න. පොඩි වෙලාවක් මූන් බැඳලා තියාගන්න." සොරු කල්ලියේ නායකයෙකු යැයි කිව හැකි අයෙකු කීය.

ජෝන් සහ මරියා ව කාමර සංකීර්ණයේ දකුණු පස කොනෙහි ම ඇති කාමරයට රැගෙන ගියේ ය.

එහි විවිධ තීන්ත වර්ග හා චිත්‍ර වර්ග විය දෙදෙනාගේ අත් හා කට රෙදි කැබලිවලින් ගැට ගසන ලදී අයෙකු මුරයට ද තබන ලදී.

"ජැක් අපි යනවා." යනුවෙන් ශබ්දයක් ඇසුණි.

"හා සර් මම මේ දෙන්නව ඉවරයක් කරන්නම්."මුර කළ පුද්ගලයා කීය.

ටික වේලාවකට පසු කාමරයට ඇතුළු වූයේ ඇලිසන් ය. ඇය අතෙහි ලේන්සුවක් විය.

අපව මුර කරන්න තැබූ මිනිසාට යන්තම් නින්ද යමින් තිබුණි. ඇලිසන් වහා කාමරයට පැන ඔහුගේ නාසය වෙත ළං කළා ය වහා සිව ගොස් මරියාගේ හා ජෝන්ගේ ගැට ගැසූ අත් ලිහින ලදී. තිදෙනා වහා ම කාමරයෙන් පැන ගත්හ.

"එන්න මේ පැත්තෙන්"

තිදෙනා උද්‍යානයට විවෘත වූ දොරෙන් තානායමෙන් පිටවූහ. ඉන්පසු පසුපස නොබලා පාරට දිව ගියෝ ය. ඉන්පසු කටට බැඳ තිබූ රෙදි කැබැල්ල ද ඉවත් කළහ.

"ඔයාට කොහොම ස්තුති කරන්න ද මන්දා ඔයා බුද්ධිමත් විදියට වැඩ කළා." ජෝන් ස්තුති කළේ ය

"අපි මේක නැන්දටයි මාමාටයි කියන්න ඕන. දැන් අපිට ඉතුරු වෙලා තිනේනේ මේ වැඩේ අන්තිම හරිය." ජෝන් කීය.

අපි වහා ම නිවසට දිව ගියෙමු.

"නැන්දේ අපි ඉක්මනට පොලීසියට යන්න ඕන. පුළුවන් ඉක්මනට මාමට එන්න කියන්න." ජෝන් වතුර බීමට කුස්සියට දුවමින් කීය.

ජෝන්ගේ දැඩි බල කිරීම මත මාමා පැමිණියේ ය.

ඉන්පසු අපි සියලු දෙනා පොලීසියට ගියෙමු. ජෝන් අපි මෙතෙක් මුහුණ දුන් සියල්ල පිළිබඳ ව කීවේ ය.

"අපි ඉක්මනට යන්න ඕන නැත්නම් අපේ මහන්සිය අපරාදේ." ජෝන් කීය.

ජෝන් කී දේ ඇසූ ඔවුන් වහා ම එහි යාමට තීරණය කරන ලදී.

අප එහි යන විටත් ඔවුන් යුහුසුලු ව පලා යාමට තැත් කරමින් සිටියහ. වහා ක්‍රියාක්මක වූ පොලීසිය ඔවුන් අල්ලා ගත්හ.

"අපිට බොරු කියන්න ලැස්ති වෙන්න එපා අපි හැම දේම දන්නවා දැන් ඉතින් ජාවාරම කරපු තැනට යං"

පඩිපෙළ නගිමින් බරාදයට පිවිසුණු පසු එළා තිබුණු  රතු පලස ඉවත් කරන ලදී. එතැනින් ලී දොරක් විවෘත විය. එය විවෘත කළ පසු භූගත කාමරයකට සම්බන්ධ කර තිබූ පඩිපෙළක් තිබුණි. එය බැස ගත් අපට දක්නට ලැබුණේ ලී බඩු, චිත්‍ර හා තීන්ත කුප්පියි.

"දැන් ඉතින් ඔය තියෙන්නෙ සාක්ෂිත් එක්කම. අපිට කවදාත් හොයගෙන්න බැරි දෙයක්නෙ මේ ළමයි අපිට හොයලා දුන්නේ. කොහොම ස්තුති කරන්නද ඔයාලට." පොලිස් නිලධාරියා කීය.

"දැන් ඉතින් ඉතුරු ටික පොලීසියට ගියා ම බලාගන්න පුළුවන්."

*******

පත්තරේ බලන්නකො

## "ජාත්‍යන්තර ජාවාරම වැටලූ පුංචිහපන්නු"

නිමි

පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණුවිද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයිපාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඈදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01

ISBN 978-624-206-618-9